# රණවිරුවාණනි, නොමියෙන මිනිසා ඔබ වේ.



ශ්‍රී ලංකාවට දේශපාලන නිදහස ලැබුණු පෙබරවාරි මාසය මෙන් ම ශ්‍රී ලාංකාවේ දෙවන නිදහස ලැබුණු මැයි මාසයත් අතිශයින් ම වැදගත් ය. අප දේශපාලන නිදහස ලබාගත්තේ අධිරාජ්‍යවාදයට එරෙහිව ගෙන ගිය අරගල සමූහයක ප්‍රතිඵල වශයෙන් ය. අප දෙවන නිදහස ලබාගත්තේ ලොව කුරිරුම ත්‍රස්තවාදයට එරෙහිව ගෙන ගිය මානුෂීය මෙහෙයුමක ප්‍රතිඵලය වශයෙන්ය. එය සිවිල් යුද්ධයක් ලෙස සමහරුන් හඳුන්වන්නේ වුව වඩාත් නිවැරදි හැඳින්වීම වන්නේ මානුෂිය මෙහෙයුම යන්න ය. හේතුව: එය සමස්ත රට වැසියන්ගේ නිදහස හා මානුෂීය අයිති වාසිකම් වෙනුවෙන් ගෙන ගිය ඓතිහාසික සටනක් වීමය.

මේ සටනේ ජයග්‍රහණය ලැබුණේ සමස්ත ජනතාවට යැයි කිව හැකි ය. සටනෙන් පසු උතුරට හා නැගෙනහිරට ප්‍රජාතන්ත්‍රවාදය ලැබිණි. ඊට පෙර මේ පළාත් දෙකම පාලනය වූයේ දරුණු අඬාදායක ත්‍රස්ත නායකයෙකු යටතේය. ඔහු ශ්‍රී ලංකාව පමණක් නොව, අසල්වැසි ඉන්දියාව පවා බිය වද්දාගෙන සිටියේය. සටනෙන් පසු ඉන්දියාව ද අපට ආශිර්වාද කළ බව සිහිපත් කළ යුතුය. උතුරට හා නැගෙනහි රට ප්‍රජාතන්ත්‍රවාදය ලැබුණු අතර දකුණට නිදහස් ජීවිත ලැබිණි. ඊට පෙර දකුණේ ජනතාව ජීවත් වූයේ කොයි මොහොතේ බෝම්බයක් පිපිරේදැයි බියෙන් හා සැකයෙන්ය.
රට හා සමස්ත ජාතිය දෙවන නිදහස ලබා වසර නමයක් ගත වී ඇත. එය ස්මරණය කළ යුතු වැදගත් අවස්ථාවක. රට එක් සේසත් කළ දුටුගැමුණු මහරජතුමා ද යුද ජයග්‍රහණය ස්මරණය කළේය. සටනට උරදුන් විරුවනට ත්‍යාග හා සම්මාන ලබා දෙමින් ඔවුන් ගෞරවයට පාත්‍ර කළේය. එය සැලකිය හැක්කේ ජාතික වගකීමක් හා ජාතික යුතුකමක් හැටියට ය.
ඕනෑම සටනක දී වැගත් ක්‍රියාධරයා බවට



පත්වන්නේ සෙබළා ය. ජයග්‍රහණයෙන් පසු අපේ සෙබළාට රණවිරුවා යන ගෞරව නාමය ලැබිණි. එය යුක්තිසහගතය. රණවිරුවන් නොවන්නට අපේ මාතෘභූමිය සදාකාලික සටන්බිමක් වීමට ඉඩ තිබිණි. ඕනෑම රාජ්‍යයකට සිය භෞමික අඛණ්ඩතාව වැදගත්ය. ජාතික ආරක්ෂාව ද වැදගත්ය. මේ දෙකම ආරක්ෂා වන්නේ විරෝදාර රණවිරුවන් අතින් ය. මානුෂීය මෙහෙයුම තුළදී රණවිරුවෝ විසිනම දහසක් රට වෙනුවෙන් ජීවිත පූජා කළහ. තවත් විශාල පිරිසක් අබාධිත තත්ත්වයට පත්වූහ. මේ සියලු දෙනා අභිමානයෙන් සැමරීම අපගේ වගවීම වනු ඇත.

මීට වසර නමයකට පෙර ලබාගත් ජයග්‍රහණයේ ප්‍රතිලාභ එක අතෙකින් පටු දේශපාලනය කරා ඇදී ගියේය. තව පැත්තකින් එය ජාතික සමඟියට එරෙහි සාධකයක් බවට පත් විය. මේ දෙකම වැරදි ය. ගැටුමෙන් පසු එය ජනතාවගේ ජයග්‍රහණයක් ලෙස සලකන්නට ඇතැම් නායකයන් හා ඇතැම් සංවිධාන පෙළඹුණේ නැත. ඒ හේතුව නිසා බලවත් රටවල් හා ජාතික සංවිධාන අපට චෝදනා කරන්නට පටන් ගත්හ. එලෙසම ජාතික සමගියට තිබූ කදිම අවස්ථාවක් ද එයින් ගිලිහී ගියේය. රටේ දෙවන නිදහස සමරන අතර අප එම සත්‍යය ද වටහාගත යුතු ය. අද වුව රණවිරු සමරුව ජාතිවාදයේ ස්වරූපයකට හරවාගැනීමට වෑයම් කරන අය සිටිති.

**(උපුටා ගැනීමකි)**

මුලු ලොව වටා සිටින සියලු ශ්‍රී ලංකික යනට ආදර්ශයක් වෙමින් ඔස්ට්‍රේලියා වේ මෙල්බර්න් නුවර **"සුරකිමු ලංකා මෙල්බර්න් එකමුතුව"** සංවිධානය කල රණවිරු සැමරුම් 2018 ඉතාම උත්කර්ශවත් ලෙස මෙන්ම අභිමානවත් ලෙස මෙවර පවත්වනු ලැබුවේ ශ්‍රී ලංකාවේ හිටපු යුධ හමුදාපති ජනරාල් දයා රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙනි.

**ශ්‍රී ලංකාවේ භෞමික අඛන්ඩාතාවය. සවෛරීභාවය, අභිමානය මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම මූලික කරගත් සුරකිමු ලංකා මෙල්බර්න් එකමුතුව ශ්‍රී ලංකාවේ ඉතාම සීඝ්‍රයෙන් ගොඩනැගෙමින් පවතින දේශපාලන අස්ථාවර බාවයට එරෙහිව මෙන්ම. ජ්‍යාත්යන්තර අභියෝග හමුවේ හඬක් නගන්නට ඇපකැපවී සිටින මවුබිමට ආදරය කරන ශ්‍රී ලංකිකයින් පෙළ ගැස්වීම වෙනුවෙන් නායකත්වය ගත් ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව තුල කාලෝචිතව බිහිවුනු ඉතාමත් ශක්තිමත් සංවිධානයකි.**

රණවිරු සැමරුම ක්‍රියාවේ සහ වචනයේ පරිසමාප්ත අර්ථයෙන් යථාර්ථයක් කිරීමට උරදුන් පූජ්‍ය පක්ෂයට, ජනරාල් දයා රත්නායක මැතිතුමාට සහ එම මැතිණියට, සියලු සාමාජිකත්වයට, කාලය ශ්‍රමය වැයකරමින් සහයෝගය දුන් සියලු හිතවතුන්ටත්, අප හා සහයෝගයෙන් ක්‍රියා කරන ස්පර් වික්ටෝරියා, ගෝලීය ශ්‍රී ලංකා සංසදය, වෙනත් ආයතන, සංවිධාන සහ සැමරුමට පැමිණි විශේෂ ආරාධිත සැමට, සහෘද ශ්‍රී ලංකිකයින්ට සුරකිමු ලංකා මෙල්බර්න් එකමුතුවේ ගෞරවණීය ආචාරය.



# Uity in DiVerSity
## Short Story

"Good Morning! My dear kettle I must have a good cup of tea." I heard Sabil saying as soon as he came to the office room.

Get who is a smart lady came forward and opened my mouth and said in surprise.

"Just see Sabil what a lot of phosphate inside this kettle? I must clean this properly before I boil water. See the colour inside. It is dark brown. It is not good to boil water in this dirty kettle. We will fall sick if we use it as it is.

Thanks to Get, she cleaned me well. Now I look clean and beautiful. She filled my tummy with fresh water and put it to boil. I am very happy to see this group in this special room.

"Hello! Brothers and sisters water is ready, come prepare your own tea or coffee. I have no time to prepare tea and coffee for you all" Get invited the friends after pouring her cup of tea.

It is interesting to observe the behavior of this multicultural, multi age, multilingual group of colleagues.

Once, I heard someone saying "I hate this kettle. Whenever I come here the kettle is empty. Once Bali, with full of anger said" the capacity of this kettle is not at all enough for our group, Is this enough for 60 people" "Why don't we ask for a bigger kettle from the Manager" suggested Muhmud. Once Baas in full of anger, said "We must put this dirty kettle to the bin. Then only the office will realize it and they will buy a new big kettle for us."

"Why can't we get two kettles ?" Helva who is an accountant ,was slowly listening to the conversation murmured. "Yes we should do something" Sabil approved it by nodding his head.

I am surprised at the rate people make tea and coffee using me every day. "Those who start work early, first thing they do is preparing and drinking a cup of tea or coffee using me". Thought the kettle.



To Page No. 25